සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන්
සභාපතුලේඛ (ලිපි අංක 18 /2020

මගේ අංකය PPSC/ES/14/FI/02/28
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලය
නවනගරය,රත්නපුර
2020.09.11

ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

**<u>සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණිය සඳහා (සීමිත බඳවා ගැනීම) අයදුම්පත් කැඳවීම -2020</u>**

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.11.11 දින අනුමත කර ඇති සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා වන බඳවා ගැනීම් පරිපාටියට අනුව ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/07/P2/09/CM/DEP/02 හා 2020.08.18 දිනැති ලිපිය මඟින් දන්වා ඇති සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව ක්‍රීඩා පුහුණුකරු තනතුරේ පුරප්පාඩු 02 සඳහා පහත සුදුසුකම්ලත්, සබරගමුව පළාත් ක්‍රීඩා ක්ෂේත්‍රයේ දැනට සක්‍රිය සේවයේ සිටින ක්‍රීඩා නිලධාරීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1.0 පළපුරුද්ද**

1.1 **සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී තනතුරේ වසර (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.**

**2.0 අයදුම්කිරීම සඳහා තිබිය යුතු වෘත්තීය සුදුසුකම්**

2.1 ක්‍රීඩා පනත යටතේ අදාළ ක්‍රීඩා ක්ෂේත්‍රයට නියමිත ක්‍රීඩා පාලක මණ්ඩලය/සංගමය විසින් හෝ ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් නිකුත් කරන ලද පුහුණුකරුවකුගේ බලපත්‍රයක් ලබා තිබීම හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිගත් ආයතනයක් විසින් අදාළ ක්‍රීඩාව සඳහා පවත්වනු ලබන මාස 03 කට නොඅඩු පුහුණු පාඨමාලාවක් හදාරා සමත් වී තිබීම.

2.2 තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හය (06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**3.0 සපුරාලිය යුතු වෙනත් සුදුසුකම්**

01. පත්වීම ස්ථිර කර තිබීම.

02. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

03. පූර්වාසන්න වසර පහක් (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

04. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගෙන තිබීම සහ ක්‍රීඩා නිලධාරී තනතුරේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත් වී තිබීම.

05. අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළකරන දිනට සපුරා තිබිය යුතු බවට සඳහන් සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම

4.0 සීමිත බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන්

| අනු අංශය | ලකුණු ලබා දෙනු ලබන ක්ෂේත්‍ර | ලකුණු | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1.ජ්‍යෙෂ්ඨත්වය | සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා නිලධාරී තනතුරට පත් වී වසර 10 සම්පූර්ණ කළ දින සිට සම්පූර්ණ එක් වසරකට ලකුණු 03 බැගින් | 30 | 30 | 40% |
| 2.අතිරේක වෘත්තීය සුදුසුකම් | i.ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ,<br><br>ක්‍රීඩා හෝ ශාරීරික අධ්‍යාපනය පිළිබඳව හෝ පරිපාලනය පිළිබඳ උපාධිය - 25<br>මාස 3 කට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා - 15<br>මාස 01 කට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා - 10<br>සති දෙකකට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා - 05<br>සති එකට වැඩි දේශීය/විදේශීය පාඨමාලාවක් සඳහා - 02 | 25 | 40 | |
| | ii. ජාතික මහා ක්‍රීඩා උළෙලකදී හෝ ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික සංගම් තරඟාවලියක අවසන් අදියරේ තරඟවල දී,<br>• පුහුණුකරුවකු වශයෙන් කටයුතු කිරීම - 10<br>• සහාය පුහුණුකරුවකු වශයෙන් කටයුතු කිරීම - 05<br>(සනාථ කිරීම සඳහා පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.) | 10 | | |
| | iii. ක්‍රීඩා තරඟ විනිශ්චයකරුවකු/තාක්ෂණික නිලධාරියකු වශයෙන් ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික විනිසුරු සංගමයක විනිසුරු බලපත්‍රයක් ලබා තිබීම (සනාථ කිරීම සඳහා ලිපි ලේඛන හා වාර්තාවල මුල්පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.) | 05 | | |
| 3.ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම පිළිබඳ අතිරේක පළපුරුද්ද හා දක්වන ලද කුසලතා | i. ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීම නිසා ඔවුන් විසින් දිස්ත්‍රික් පළාත් හා ජාතික ක්‍රීඩා උළෙලකදී (රන්, රිදී, ලෝකඩ පදක්කම් පමණක් සැලකිල්ලට ගනු ලැබේ.) දක්වන ලද දක්ෂතා වෙනුවෙන් (සනාථ කිරීම සඳහා ලිපි ලේඛන වාර්තාවල සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.)<br>• පිළිගත් ජාත්‍යන්තර තරඟ නියෝජනය කිරීම - 15<br>• ජාතික තරඟ<br>1 වන ස්ථානය - 10<br>2 වන ස්ථානය - 7.5<br>3 වන ස්ථානය - 05<br>නියෝජනය - 03<br>• පළාත් තරඟ<br>1 වන ස්ථානය - 05<br>2 වන ස්ථානය - 03<br>3 වන ස්ථානය - 02<br>• දිස්ත්‍රික් තරඟ<br>1 වන ස්ථානය - 03<br>2 වන ස්ථානය - 02<br>3 වන ස්ථානය - 01<br><br>ii. ක්‍රීඩා පුහුණු සංවිධානයක් පවත්වා ගෙන යාම - 05 | 20 | 20 | |
| 4.අමතර සුදුසුකම් | i.ක්‍රීඩා පුහුණුකරු තනතුරේ වැඩ බැලීම/වැඩ ආවරණය කිරීම - 05<br>(විධිමත් පත්වීම ලිපියක් තිබිය යුතු ය)<br>ii.ප්‍රශංසා සහතික සඳහා - 02<br>iii.දිස්ත්‍රික් සංගම්වල නිලතල දැරීම - 01 | 05 | 05 | |
| 5.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | සාමාන්‍ය දැනුම හා පෞරුෂය | 05 | 05 | |
| | මුළු ලකුණු | 100 | 100 | |

5.0 අයදුම්කළ යුතු අන්දම

මෙහි පසුපිටෙහි සඳහන් ආදර්ශ අයදුම්පත් ආකෘතිය ප්‍රකාරව පිළියෙළ කරගත් අයදුම්පත්‍රයක් සබරගමුව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශ ලේකම්ට ඉදිරිපත් කළ යුතු ය. ක්‍රීඩා කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් තමන්ට අයදුම්පත් ඉදිරිපත් වූ වහාම එකම ආවරණ ලිපියක් යටතේ මෙම කොමිෂන් සභාව වෙත 2020.10.02 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතු ය. (එම අයදුම්පතෙහි තොරතුරු පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කර බලා අයදුම්පත් ආකෘතියේ අදාළ කරුණු සහතික කරමින් මෙම කාර්යාලයට එවිය යුතු ය.) නියමිත සුදුසුකම් සපුරා ඇතැයි පෙනී යන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කිරීම සඳහා වූ විභාග ප්‍රවේශපත්‍ර අයදුම්පත්‍රයේ සඳහන් කාර්යාලීය ලිපිනයට යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

පී.එස්.ආර්.එම් විජයරාජ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

පිටපත්
01.ප්‍රධාන ලේකම්, සබරගමුව පළාත් සභාව - කාරුණික දැනගැනීම සඳහා

## අයදුම් පත්‍රය

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණිය සඳහා (සීමිත බඳවා ගැනීම) අයදුම්පත් කැඳවීම -2020

---

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු සමඟ නම -

..............................................................................................

1.2 මුලකුරු වලින් හැඳින්වෙන නම -

..............................................................................................

2.0 2.1 දැනට සේවය කරන ස්ථානයේ රාජකාරි ලිපිනය-

..............................................................................................

..............................................................................................

2.2 දුරකථන අංකය - පෞද්ගලික.......................................................

කාර්යාලීය.......................................................

3.0 සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනට දරණ තනතුර හා ශ්‍රේණිය

..................................

4.0 ඉහත තනතුරට හා ශ්‍රේණියට පත් වූ දිනය ........................................

5.0 ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත් වීමට අදාළ විස්තර

| විභාගය නම | සමත් වූ දිනය |
| --- | --- |
| ............................... | ................................... |
| ............................... | ................................... |
| ............................... | ................................... |

6.0 ක්‍රීඩා ක්ෂේත්‍රයේ ක්‍රීඩා නිලධාරී පත්වීමෙහි ස්ථිර කිරීමේ ලිපියක් ලැබී තිබේ ද? .....................

7.0 සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ක්‍රීඩා නිලධාරී තනතුරේ සේවා කාලය ? .....................

8.0 අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත් වසර? ................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

.................................... ....................................

දිනය අයදුම්කරුගේ අත්සන

සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කරන ..............................................මහතා/මෙනවිය/මහත්මිය විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත් ඒ අනුව සබරගමුව පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා පුහුණුකරු III ශ්‍රේණිය සඳහා සීමිත බඳවාගැනීමට අයදුම්කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති /නැති බවත් නිර්දේශ කරමි/නොකරමි.

(නිර්දේශ නොකරන්නේ නම් එයට හේතු සඳහන් කරන්න)

....................................

දෙපාර්තමේන්තු

ප්‍රධානියාගේ අත්සන

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

ඉහත නම සඳහන් අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව ඉහත තොරතුරු නිවැරදිය. අදාළ කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව පසුගිය වසර 10 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත/නැත. පූර්වාසන්න වසර 05 තුල සතුටුදායක සේවාකාලය සම්පූර්ණ කර ඇත/නැත. වසර 10 ක් තුළ වැටුප් වර්ධක උපයාගෙන ඇති/නැති බවත් පසුගිය කාලය තුළ දී ඔහු/ඇය විනයානුකූල දඬුවමකට භාජනය වී ඇත/නැත. ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූල කටයුත්තක් ආරම්භකර ඇත/නැත. විනයානුකූල කටයුත්තක් ආරම්භ කිරීමට අදහස් කර ඇත/නැත.

.................................... ....................................

දිනය ලේකම්

සබරගමුව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය

(කරුණාකර නිල මුද්‍රාව තබන්න)